සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணை மதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | පැය / மணித்தியாலம் / Hours: 02 |

**සැලකිය යුතුයි**

- පළමු කොටසෙහි අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. 1,11 පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

---

- පහත වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) විභාගය සමත් වූ තම දරුවා දුටු මවගේ <u>හිසේ මලක් පිපුණි</u>.

i. හිසට මලක් පැමිණීම ii ඉමහත් ප්‍රීතියට පත්වීම
iii ඉතා පීඩාවට පත්වීම Iv. ඉතාම දුකට පත්වීම

02) නංගී නිතර ම <u>කිඹුල් කඳුළු හෙළන</u> බව අක්කා පැවසුවා ය.

i පුරුද්දට ඇඬීම. ii. කෑ ගසා ඇඬීම.
iii කිඹුලෙකු සේ ඇඬීම. Iv. බොරුවට ඇඬීම.

03) 'අතු කඩා මොර කන්නා වාගෙයි' යන ප්‍රස්තාව පිරුළට වඩාත් සමීප අර්ථය වන්නේ,

i. ආදායම් මාර්ග සම්පූර්ණයෙන් ම වසා ගැනීම.
ii. දැඩි මහන්සියක් දරා ඉතා සුළු දෙයක් ලබා ගැනීම.
iii. වැඩකට නැති වැඩක් කිරීම.
iv. ඉතා පුදුම දෙයක් සිදු කිරීම.

04) නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

i. උපකරන - පරිනාමය
ii. සණ්ධ්‍යාර - පුස්ථකාලය
iii. ප්‍රස්තාර - ආස්වාදය
iv. පිලිබඳ - නිශ්චල

05) මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචනය වන්නේ,

i. විමර්ශන ii. පාඨශාලාව
iii ආමන්ත්‍රණ iv අපේක්ෂක

06) සඤ්ඤක අක්ෂර සහිත පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

i ශිඛර , පුෂ්ප ii මුද්‍රණ , වර්ණ
iii ළපටි , ප්‍රණාම iv අඹර , සුවඳ

07) පහත සඳහන් වාක්‍යයේ හිස්තැනට ගැළපෙන වචනය වන්නේ,

දරුවා දුවන විට වැටී ..................... හිස තුවාල වී ඇඬුවේ ය.

i දණ  ii දන  iii ධණ  iv ධන.

08) ප්‍රථම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද වන්නේ,

i ළමයා , ඔහු , ඔබ  ii ඔහු , ඇය , ළමයා
iii ඇය , මම , ඔහු  iv ළමයා , ඔබ , ඇය

09) ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

i ඇත්තු ගස් පෙරළයි  ii තාරකා අහසේ බබළති.
iii දරුවෝ ගී ගය යි.  iv ගොවියෝ කුඹුරු කොටති.

10) * **<u>වෙළඹ</u>** වේගයෙන් දුවයි.
* **<u>කිකිළී</u>** ආහාර සොයමින් ඇවිදියි.
* **<u>සෙබඩ</u>** වැව් ඉස්මත්තේ සිටියි.

ඉහත වාක්‍යයන්හි ඉරි ඇඳි ස්ත්‍රී ලිංග නාම පදවලට ගැළපෙන පුරුෂ ලිංග නාම පද පිළිවෙළින් ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,

i කුකුළා, මොනරා, අශ්වයා  ii මොනරා, කුකුළා, අශ්වයා
iii අශ්වයා, කුකුළා, මොනරා  iv මොනරා, අශ්වයා, කුකුළා

11) උක්ත පදයට ගැළපෙන නිවැරදි අනුක්ත පදය යෙදී ඇති වචන යුගලය තෝරන්න.

i ළමයා - ළමයි  ii ළමයා - ළමයින්
iii ළමයි - ළමයෙක්  iv ළමයි - ළමයින්

12) පහත වාක්‍යයේ ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද වර්ග අනුපිළිවෙළින් යෙදුණු පද පේළිය තෝරන්න.

- අක්කා ගඟට <u>ගොස්</u> සඳ එළියේ ගී <u>ගයමින්</u> ඔරු <u>පදියි</u>.

i පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා  ii මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා
iii පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා , මිශ්‍ර ක්‍රියා  iv අවසාන ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා

13) මුලින් දී ඇති පදයට සමාන අර්ථය දෙන පදය, තෝරා යටින් ඉරක් අඳින්න.
i අහස - පවන  ii සඳ - නිශාකර
iii මුහුද - නදිය  iv කීර්තිය - අපකීර්තිය

14) සමාජයේ සිටින <u>උත්තම</u> මිනිස්සු <u>යහපත්</u> ක්‍රියාවල යෙදෙති.
මෙම වාක්‍යයේ ඉරි ඇඳි පදවලට පිළිවෙළින් ගැළපෙන විරුද්ධාර්ථවත් පද යුගලය තෝරන්න.
i අභයපත් - අධම  ii සම්මාන - අයහපත්
iii අධම - අභයපත්  iv උසස් - අයහපත්

15) * උදව්වට වැඩ කර දීම.
* ආහාර අනුභව කිරීම
* අම්බරුවන් දිරිමත් කරන හඬ ගෑම
ඉහත සඳහන් ක්‍රියාවලීන් කමත් භාෂාවෙන් හැඳින්වූ විට නිවැරදි පිළිවෙළ වන්නේ,

i අත්තම , අඬහැරය , සප්පායම    ii අඬහැරය , සප්පායම , අත්තම
iii අත්තම , සප්පායම , අඬහැරය    iv සප්පායම , අඬහැරය , අත්තම

16) කොළ මඩවන වේලාවයි
කමත පිරෙන වේලාවයි
මෙහි "කොළ මඩවන" ලෙස හැඳින්වූයේ

i කොළ වර්ග තැන්පත් කිරීමයි.    ii ගොයම් පාගන භූමියයි.
iii කොළ මැඩීම සඳහා බිම සැකසීමයි.    iv ගොයම් පෑගීමයි.

17) අභිකුණ්ඨික ජනයා තම බස් වහර ලෙස භාවිත කරනුයේ,

i සිංහල පාලි මිශ්‍ර බස් වහරකි.    ii සිංහල දෙමළ භාෂා මිශ්‍ර බස් වහරකි.
iii තෙළිඟු බසින් නිපදවාගත් බස් වහරකි.    iv දෙමළ හා පාලි මිශ්‍ර බස් වහරකි.

18) එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි විසින් රචනා කරන ලද ග්‍රන්ථය,

i මහා බෝධිවංශ සන්නය.    ii සිරිලක මරිය බැතිය.
iii සද්ධර්මාලංකාරය.    iv සාරාර්ථ සංග්‍රහය.

- ප්‍රශ්න අංක 19-20 දක්වා වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

19) ගස් මලින් සැරසී අලංකාර ...............................
i වෙයි    ii වූහ    iii වෙති    iv වන්නෝ ය

20) ලේඛකයෝ පාඨකයන් දැනුවත් ..................

i කළා ය    ii කළේ ය    iii කරයි    iv කරති

(ලකුණු 2 X 20 = 40)

## <u>II කොටස</u>

1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3,4,5,6,7 ප්‍රශ්නවලින් තවත් **ප්‍රශ්න තුනක්** තෝරා ගෙන ප්‍රශ්න <u>පහකට</u> පිළිතුරු ලියන්න.

**01. ප්‍රස්තාව පිරුළුවලට අදාළ ව ඔබ විසින් පන්ති කාමරයේදී සකස් කළ පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

i. පොත් පිංචට ඔබ යෙදූ නම කුමක් ද? (ලකුණු 02)
ii. ඔබේ පොත් පිංචට ඇතුළත් කළ කතන්දරවලට මුල් වූ ප්‍රස්තාව පිරුළු **දෙකක්** ලියන්න. (ලකුණු 02)
iii. පොත් පිංච සකස් කිරීමේදී තොරතුරු ලබාගත් මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
iv. පොත් පිංච නිර්මාණය කිරීමේදී ලකුණු ලැබුණු නිර්ණායක **දෙකක්** ලියන්න. (ලකුණු 02)
v. ඔබගේ නිර්මාණ සංග්‍රහයෙන් පන්තියේ අනෙක් සිසුන්ට ලැබුණු ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න (ලකුණු 04)
vi. මෙවැනි නිර්මාණයක් කිරීමෙන් ඔබ ලබා ගත් ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

02.පහත දැක්වෙන මාතෘකා වලින් **එකක්** තෝරා ගෙන වචන **150** ට නො අඩු වන සේ රචනයක් ලියන්න.

1. අපේ පරිසරය අපිම සුරකිමු.
2. සරණංකර සඟරජ තෙරණුවෝ.
3. අපේ පාසලේ ක්‍රීඩා උත්සවය දා.
4. පොත් පත් කියවීමේ අගය.
5. මුහුදු වෙරළක අසිරිය වින්දෙමි. (ලකුණු 14)

03.පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. පුන්සඳ මඬල වැජඹෙන සඳ අහස පිට
දිලිහෙයි මදින් මද තරුමල් කනක කැට
වවුලෝ පියඹා යති අඹ උයන සිට
සඳරැස් වැටෙයි කවුළුවකින් නිදන ගෙට

2. අමුතු ම හැඟීමක් දෙයි මඳ සුළඟ හැමී
නව තණ පිටිය බබළයි පිනි පොදට තෙමී
පොඩි දුව සොයා එන හාවා පනින පිමී
ඇය නිදියන බැවින් මම දැක සතුටු වෙමී

1. ඉහත පද්‍ය පෙළින් හඟවන කාලය කුමක්ද?
2. වවුලෝ පියඹා යන්නේ කොහි සිටද?
3. තණ පිටිය බබළන්නේ කුමක් නිසාද?
4. දෙවන කවියේ සඳහන් විශේෂණ පද දෙකක් ලියන්න.
5. පහත සඳහන් පදවලට අර්ථ ලියන්න.
   I. මඬල ................................ 2. කනක ..................... (ලකුණු 2 X 5 = 10)

04.සිංහල භාෂාව හා සාහිත්‍යය සමස්ත ලංකා කථික තරගයෙන් ප්‍රථම ස්ථානය ලැබූ ඔබේ පාසලේ මිතුරෙකුට / මිතුරියකට ආශීර්වාද කිරීම සඳහා සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

නැතහොත්

ඔබ පාසලෙන් ගිය අධ්‍යාපන චාරිකාව පිළිබඳ තොරතුරු දන්වා වෙනත් පාසලක සිටින මිතුරියකට ලිපියක් ලියන්න. (ලකුණු 10)

05.පෙළ පොත ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

"ඇයි, ඉතින්, ගැලවෙන විදියක් ඔබ ම කල්පනා නො කරන්නේ? "

i. ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද?
ii. එසේ පැවසුවේ කා හටද ?
iii. මෙම ප්‍රකාශය කළ අයට සිදු වූ කරදරය කුමක්ද ?
iv. මෙය උපුටා ගත් පාඩමේ නම ලියන්න.
v. එය අයත් වන්නේ කුමන කතා විශේෂයකට ද ?

(ලකුණු 2 X 5 = 10)

06 "මල්ලී ,ඔය කොළ මුත්තා ගොයම් 'සාත්තු' කෙවිටෙන් තට්ටු කරල ගමන ඉක්මන් කරන්න. "

i. මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
ii. එසේ පැවසුවේ කා හටද ?
iii. ගොයම් 'සාත්තු' යන්නෙහි අදහස කුමක් ද?
iv. මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද?
v. මෙම පාඩමෙන් කුමන වෘත්තියක් ගැන කියවේ ද?

(ලකුණු 2 X 5 = 10)

07.පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ජලය පිළිබඳ සුප්‍රකට නියමයන් සොයා ගත් මහා විද්‍යාඥ ආකිමිඩීස් සිසිලි දූපතේ සයිරකියුස් නගරයේ උපත ලැබුවේ ක්‍රි.පූ. තුන්වැනි සියවසෙහි ය. යුද සොල්දාදුවෙකුගේ ප්‍රහාරයකට ලක්ව ඔහු මිය ගියේ ක්‍රි.පූ. 212 දී යැයි කියනු ලැබේ. ක්‍රි.පූ. තුන්වැනි සියවස ශ්‍රී ලංකාවේ සංස්කෘතික විප්ලවය ආරම්භය සිදු වූ වකවානුවයි. ආර්යයන් ලංකාවට පැමිණ ජනපද පිහිටුවා ගැනීමෙන් අනතුරුව මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කිරීමෙනි, මේ රට සංස්කෘතික විප්ලවයට මග පෑදුණේ, මහින්දාගමනය නිසා අනුරාධපුරයේ පමණක් නොව සමස්ත දිවයිනේ ම නව පිබිදීමක් ඇති විය. මහින්දාගමනය සිදුවන විටත් ලක්වැසියන් ජල කර්මාන්ත පිළිබඳ දැනුම ලබා සිටි බවට සාධක අනුරාධපුරයෙන් ලැබේ. දැන් බසවක්කුලම යන නමින් හැඳින්වෙන අභය වැව බඳවන ලද්දේ මහින්දාගමනයට පෙර ය. එහි නිර්මාතෘවරයා වූයේ පණ්ඩුකාභය රජතුමාය. දැන් වැව් බැඳි රාජ්‍යය යන විරුද නාමයෙන් හැඳින්වෙන රජරට බඳින ලද ප්‍රථම වැව ලෙස මෙය සැලකිය හැකිය.

1. ආකිමිඩීස් මහා විද්‍යාඥයාගේ නව සොයා ගැනීම නම් කරන්න.
2. ඔහු උපත ලද නගරය කුමක් ද?
3. ශ්‍රී ලංකාවේ සංස්කෘතික විප්ලවයේ ආරම්භය සිදු වූයේ කිනම් සියවසක ද?
4. මහින්දාගමනය සිදුවන විට ලක් වැසියන් ජල කර්මාන්තය පිළිබඳ දැනුම ලබා සිටි බවට සාධකයක් සඳහන් කරන්න.
5. රජරට හැඳින්වෙන විරුද නාමය ලියන්න.

(ලකුණු 2 X 5 = 10)